# පිළියන්දල අධ්‍යාපන කලාපය
# Piliyandala Education Zone

6 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2025

ඉතිහාසය I , II

පැය දෙකයි
**Two Hours**

නම :-

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) අපේ රටේ ඉතිහාසය ගැන තොරතුරු දැනගත හැකි මූලාශ්‍රය බොහොමයක් ............... දක්නට ලැබේ.
( කෞතුකාගාරයේ / පාර්ලිමේන්තුවේ )

(02) වර්තමානය වඩා යහපත් කර ගැනීමට ................................ ප්‍රයෝජන ගත හැකිය.
( අනාගතයෙන් / ඉතිහාසයෙන් )

(03) ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තියෙන් පසු කාලය ................................ ක්‍රමයට අදාළ වේ.
( ක්‍රිස්තු වර්ෂ / ක්‍රිස්තු පූර්ව )

(04) කැණීමකදී පොළව හාරන විට වඩාත් ඈත අතීතයේ තිබූ දේවල් ............... තිබෙන පස් තට්ටු අතර හමුවෙයි. ( මතුපිටම / ගැඹුරින්ම )

(05) ඉස්ලාමීය සංස්කෘතිය තුළ භාවිතා කරන වර්ෂ ක්‍රමයක් ......... දී ආරම්භ විය.
( ක්‍රි.ව 78 / ක්‍රි.ව. 622 )

(06) ලෝකයේ මුල්ම ජීවීන් .......................... බිහි විය.
( ගොඩබිම / ජලයේ)

(07) පෘථිවිය නිර්මාණය වීමෙන් පසුව මුලින්ම ගොඩබිම පැතිරී ගියේ .......................... වර්ග වේ.
( ශාක / සත්ත්ව )

(08) පුරා ශිලා යුගයේ මානවයා ඇටසැකිලි මත වර්ණ ආලේප කිරීමට ...................... යොදා ගත්හ.
( තිරිවානා ගල් / ගුරු ගල් )

(09) වෘත්තයකට අංශක 360 ක් ඇති බව ................ ගණිතඥයෝ සොයා ගත්හ.
( ඉන්දුනිම්නයේ / මෙසපොතේමියාවේ )

(10) කාලිබන්ගන් නගරය ........................ ශිෂ්ටාචාරයට අයත් ය.
( ඊජිප්තු / ඉන්දුනිම්න )

- පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද දී ඇති වරහන් තුළ යොදන්න.

(11) මෙසපොතේමියාව පාලනය කළ හමුරාබි නම් පාලකයා නීති මාලාවක් සහිත ලේඛනයක් සකස් කර තිබේ. (  )

(12) ඊජිප්තු ශිෂ්ටාචාරයේ වැසියෝ පාරාවෝ නමින් දෙවිවරු විශේෂයක් අදහන ලදි. (  )

(13) හෝමෝ හැබිලිස් මානවයාට ඒ නම ලැබී තිබෙන්නේ "හැකි මිනිසා" යන තේරුම ඇතිවයි. (  )

(14) දූපතක් වූ අපේ රටට මිනිසුන් පැමිණ ජනාවාස වූයේ මීට අවුරුදු 3500 ක් පමණ ඉහත කාලයකදී ය. (  )

(15) පාසල් සඟරාවේ ලියා තිබෙන විවිධ ලිපි වලින් පාසලේ ඉතිහාසය ගැන විවිධ තොරතුරු ලබාගත හැක. (  )

- පහත දැක්වෙන A හා B කොටස් හොඳින් කියවා නිවැරදි ලෙස ගලපන්න. (ඉරකින් සම්බන්ධ කරන්න)

| A | B |
|---|---|
| (16) ගෞතමීපුත්‍ර සාතකර්ණී රජු ශකවරුන් පරාජයට පත් කිරීම සිහිපත් වීමට | • නල පද්ධතියක් භාවිතා කර තිබේ. |
| (17) ඊජිප්තු ශිෂ්ටාචාරයේ මියගිය රජුන්ගේ මළ සිරුරු තැන්පත් කිරීමට | • හොලෝසීන භූ අවධියේ ය. |
| (18) වෙඩි බෙහෙත්, මාලිමා යන්ත්‍රය | • ක්‍රි.ව. 78 න් ආරම්භ වන වර්ෂ ක්‍රමය සකසා තිබේ. |
| (19) පෘථිවියේ අධික ශීත දේශගුණය උණුසුම් බවට පත්වූයේ | • පිරමිඩ තැනවීම සිදුකර ඇත. |
| (20) ඉන්දුනිම්න නගරවල ජනතාව අපද්‍රව්‍ය බැහැර කිරීමට | • චීන ශිෂ්ටාචාරයේ වැසියන්ගේ නිර්මාණ වේ. |

(ල. 2 x 20 = 40)

## 6 ශ්‍රේණිය - ඉතිහාසය

## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් කැමති ප්‍රශ්න 4 ක් තෝරාගෙන පිළිතුරු ලියන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.

(01) (a)




ඉහත දැක්වෙන සිතියමේ

(i) ඊජිප්තු ශිෂ්ටාචාරය පිහිටි ප්‍රදේශය පැන්සලකින් සේයාකර C අක්ෂරය යොදා පෙන්වන්න.

(ii) ඉන්දුනිම්න ශිෂ්ටාචාරය පිහිටි ප්‍රදේශය පැන්සලකින් සේයාකර B අක්ෂරය යොදා පෙන්වන්න.

(iii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටි ප්‍රදේශය පැන්සලකින් සේයාකර A අක්ෂරය යොදා පෙන්වන්න. (ල. 2 x 3 = 6)

(b) (i) මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද ?

(ii) මෙය කුමන ශිෂ්ටාචාරයකට අයත් ද?

(iii) මේවා යොදාගත්තේ කුමකට ද?



(ල. 2 x 3 = 6)

- පහත දැක්වෙන ප්‍රශ්නවලින් කැමති 4 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(02) (i) ඔබේ පාසලේ ඉතිහාසය ගැන තොරතුරු සොයාගත හැකි මූලාශ්‍ර 2 ක් ලියන්න. (ල. 2)

(ii) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඉතිහාසය හැදෑරීමට ඉතා ප්‍රයෝජනවත් වේ. ලංකාවේ ඉතිහාසය හැදෑරීමට යොදාගත හැකි පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර 4 ක් නම් කරන්න. (ල. 4)

(iii) වර්තමානයේ අපට ඇතිවන ගැටළුවක් ඉතිහාසය දෙස බලා විසඳාගත හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)

(03) (i) ඊජිප්තු ශිෂ්ටාචාරයේ වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය නම් කරන්න. (ල. 2)



(ii) a) රූපයෙන් දැක්වෙන්නේ කවුද ?

b) ඇය කිනම් රජුගේ බිසවද ? (ල. 2 x 2 = 4)

(iii) ඊජිප්තුවේ නිර්මිත පිරමිඩ ගැන වැදගත් කරුණු ඇතුළත් කර ජේළි 6 ක විස්තරයක් ලියන්න. (ල. 6)

(04) (i) නෙබියුලාවක් (නිහාරිකාවක්) ලෙස හඳුන්වන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ල. 2)

(ii) ගොවිතැන ආරම්භවීමෙන් ආදි මානවයාට ලැබුණ වාසි 2 ක් ලියන්න. (ල. 4)

(iii) පෘථිවියේ මිනිසා බිහිවීම ගැන වැදගත් කරුණු ඇතුළත් ජේළි 6 ක් ලියන්න. (ල. 6)

(05) (i) පුරා ශිලා යුගයේ වැදගත් ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 2)

(ii) මධ්‍ය ශිලා යුගයේ වැදගත් ලක්ෂණ 2 ක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල. 4)

(iii) නව ශිලා යුගය පිළිබඳව වැදගත් තොරතුරු සාරාංශකර වාක්‍ය 6 ක් ලියන්න. (ල. 6)

(06) (i) මිනිසා නිර්මාණය වීමට (බිහිවීමට) පදනම් වූ අප්‍රිකානු වානර වර්ගය නම් කරන්න. (ල. 2)

(ii) පහත දැක්වෙන මානවයන්ගේ විශේෂ ලක්ෂණ එක බැගින් නම් කරන්න. (ල. 4)

a) ඔස්ට්‍රලෝපිතිකස් b) හෝමෝ හැබිලිස්

c) හෝමෝ ඉරෙක්ටස් b) හෝමෝ සාපියන්

(iii) පෘථිවියේ බිහිවීම සිදු වූ ආකාරය පිළිබඳ වැදගත් කරුණු ඇතුළත් කරමින් ජේළි 6 ක් ලියන්න. (ල. 6)

(07) (i) ශ්‍රී ලංකාවේ මුල්ම ජනාවාසවල වාසය කළ ජනතාව ආහාර සොයාගැනීමට අනුගමනය කළ ක්‍රම දෙක නම් කරන්න. (ල. 2)

(ii) ශ්‍රී ලංකාවේ මුල්ම ජනාවාසවල වැසියන් ආහාරයට ගත් දේවල් 4 ක් නම් කරන්න. (ල. 4)

(iii) ශ්‍රී ලංකාවේ මුල්ම ජනාවාස පිළිබඳව පහත දැක්වෙන මාතෘකා යටතේ වැදගත් කරුණු දෙක බැගින් ලියන්න. (ල. 2 x 3 = 6)

a) ආභරණ භාවිතය b) වාසස්ථාන c) අවමංගල චාරිත්‍ර